# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2293/22 - 2022 අගෝස්තු මස 16 වැනි අඟහරුවාදා - 2022.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV) (බී)

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(අ) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1)(අ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වන, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින් (කලින් කල සංශෝධිත) 2007 ඔක්තෝබර් මස 09 වැනි දින අංක 1518/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි I වන තීරයේ සඳහන් "සම සෞඛ්‍ය විද්‍යා පීඨය" යන අයිතමයට සහ එහි II වන තීරයේ අනුරූප සටහන්වලට ඉක්බිතිව ම (2019 සැප්තැම්බර් මස 02 වැනි දින අංක 2139/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති), පහත දැක්වෙන අයිතමය සහ සටහන් එකතු කිරීමෙන්:-

| I වන තීරය<br>පීඨය | II වන තීරය<br>අධ්‍යයන අංශය |
|---|---|
| "ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් ප්‍රාසාංගික සහ දෘශ්‍ය කලා පීඨය | 1. සංගීත අධ්‍යයනාංශය<br>2. වාද්‍ය සංගීත අධ්‍යයනාංශය<br>3. නැටුම් අධ්‍යයනාංශය<br>4. සිතුවම් අධ්‍යයනාංශය<br>5. මූර්ති අධ්‍යයනාංශය<br>6. නාට්‍ය සහ රංග කලා අධ්‍යයනාංශය"; සහ |

(2) එහි I වන තීරයේ සඳහන් "කලා පීඨය" යන අයිතමය සහ එහි II වන තීරයේ අනුරූප සටහන් (2020 පෙබරවාරි මස 19 දින අංක 2163/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය සහ සටහන් ආදේශ කිරීමෙන්:-

| I වන තීරය<br>පීඨය | II වන තීරය<br>අධ්‍යයන අංශය |
|---|---|
| "කලා පීඨය | 1. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය |
| | 3. දර්ශන විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශය |
| | 4. වාග් විද්‍යාව සහ ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යයන අංශය |
| | 5. ක්‍රිස්තියානි සහ මුස්ලිම් ශිෂ්ටාචාරය පිළිබඳ අධ්‍යයන අංශය |
| | 6. දෙමළ භාෂාව පිළිබඳ අධ්‍යයන අංශය |
| | 7. ඉතිහාසය පිළිබඳ අධ්‍යයන අංශය |
| | 8. අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයන අංශය |
| | 9. ලලිත කලා පිළිබඳ අධ්‍යයන අංශය |
| | 10. දේශපාලන විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශය |
| | 11. සමාජ විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශය |
| | 12. නීති අධ්‍යයන අංශය |
| | 13. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශය |
| | 14. මාධ්‍ය අධ්‍යයන අධ්‍යයනාංශය |
| | 15. භාෂා පරිවර්තන අධ්‍යයන අධ්‍යයනාංශය." |

**ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත්,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0138

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.